**නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන (ප්‍රදාන) - 2021**
**------------------------------------------------------------**

නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ (ප්‍රදාන) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 මැයි 11 දින එළඹි අංක 9193 එස්ආර්අයි (ඊඑෆ්) දරන ප්‍රදාන ගිවිසුමේ iv ව්‍යවස්ථාවේ 4.02(අ) වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය
**----------------------------------------------------------------------------------**

ප්‍රදාන ගිවිසුමට අනුව , එවකට නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය එනම් වත්මන් අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර අනෙකුත් ආයතන 10 ක් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. (අ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු අංශය වෙත පෞද්ගලික අංශයේ දායකත්වය වැඩි කිරීම (ආ) ස්වයං රැකියාවන් සඳහා කාන්තාවන් ඉලක්ක කර ගත් ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් වැඩි දියුණු කිරීම (ඇ) සාම්ප්‍රදායික නොවන අංශ වෙත කාන්තාවන් ආකර්ශනය කර ගැනීම සඳහා ඉලක්කගත දිරිගැන්වීම්, උපදේශනය සහ රැකියා මත පුහුණුව ලබා දීම සහ (ඈ) පෞද්ගලික අංශය තුළ ස්ත්‍රී පුරුෂ බදවා ගැනීම් හා වැඩ කළ හැකි පරිසරයක් නිර්මාණය කිරීම වැඩසටහනේ අරමුණු වේ. ප්‍රදාන ගිවිසුම ප්‍රකාරව වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 534 කට සමාන එජඩො මිලියන 3 ක් වූ අතර දරිද්‍රතාවය අවම කිරීම සඳහා වන ජපන් අරමුදල විසින් ප්‍රදානයක් ලෙස ලබා දීමට අපේක්ෂිත වන අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් එහි පරිපාලන කටයුතු සිදු කරනු ලබයි. වැඩසටහන එහි කටයුතු 2018 වර්ෂයේ නොවැම්බර් 16 ආරම්භ කරන ලද අතර 2023 ජූනි 30 වනවිට නිම කිරීමට නියමිතය.

## 1.3 තත්ත්වාගණනය කළ මතය
**-----------------------------**

මගේ වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනෙහි (ප්‍රදාන) මූල්‍ය ප්‍රකාශනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව වැඩසටහනේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම
**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

---

මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයක් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහන මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින්, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සමස්ත ඉදිරිපත් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම. හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරික්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව වගකීම් දරන්නන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩුව | වටිනාකම රු.මිලියන | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන අනුව 2021 වර්ෂයේ දරන ලද වියදම ලෙස රු.මිලියන 52,558 කට සමාන එජ ඩො. 266,245 ක් දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද ප්‍රදාන මුදල් ආපසු ලබා ගැනීමේ අයදුම් පත්‍ර අනුව වර්ෂයේ මුළු වියදම රු.මිලියන 57,010 කට සමාන එජ ඩො. 291,099.19 ක් විය. මේ අනුව නොනිමි වැඩ ගිණුම රු.මිලියන 4,452ක් අඩුවෙන් ගිණුම්ගත වී ඇති බව නිරීක්ෂණය විය. | 4,452 | සත්‍ය.<br>මුදල් ආපසු ලබා ගැනීමේ අයදුම් පත්‍රවල මුළු වටිනාකම සහ 2021 වර්ෂයේ අවසන් ගිණුම් වලට අදාල මුළු වියදම අතර වෙනසක් තිබුණි. | වරද නිවැරදි කර ගැනීමට පියවර ගත යුතුය. |

### 2.2 රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| රීති, හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2007 අගෝස්තු 07 දිනැති අංක MOFP/ERD/2007/2 දරන චක්‍රලේඛය | වැඩසටහනෙහි 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත 2022 මාර්තු 31 දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු වුවත්, වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2022 ජුලි 12 දිනය. | එකගයි.<br>අනුමත ක්‍රියාත්මක කිරිමේ හවුල්කරුවන්ගේ මූල්‍ය කළමනාකරන ගැටලු හේතුවෙන් පිළිගත නොහැකි ප්‍රමාදයක් ඇතිවිය. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ප්‍රදාන මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**2.3 මුදල් ආපසු ගැනීමේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන්**

| අංකය | ආපසු ලබාගැනීමේ අයදුම්පත් අංකය | කාලපරිච්ඡේදය | ඉදිරිපත් කළ දිනය | ප්‍රමාද වූ කාලය (මාස) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | 05 | 2020 මාර්තු සිට 2020 ජුලි | 2021 පෙබරවාරි 17 | 4-9 | මෙම ප්‍රමාදය අමාත්‍යාංශය හා අසියානු සංවර්ධන බැංකුව විසින්ද හඳුනාගෙන ක්‍රියාත්මක කරන හවුල්කරුට උපදෙස් දෙන ලදී.එය 2022 වර්ෂයේදි නිවැරදි කරන ලදී. | මුදල් ආපසු ගැනීමේ අයදුම්පත් නියමිත වේලාවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | 06 | 2020 අගෝස්තු සිට 2020 දෙසැම්බර් | 2021 අප්‍රේල් 20 | 2-6 | | |
| (ඇ) | 07 | 2021 ජනවාරි සිට 2021 පෙබරවාරි | 2021 ජුලි 22 | 3-4 | | |
| (ඈ) | 08 | 2021 මාර්තු සිට 2021 ජුනි | 2021 අගෝස්තු 25 | 1-3 | | |
| (ඉ) | 10 | 2021 අගෝස්තු | 2021 නොවැම්බර් 19 | 1 | | |
| (ඊ) | 11 | 2021 සැප්තැම්බර් | 2021 දෙසැම්බර් 14 | 1 | | |
| (උ) | 12 | 2021 නොවැම්බර් | 2022 මාර්තු 21 | 2 | | |
| (ඌ) | 13 | 2021 දෙසැම්බර් | 2022 මාර්තු 24 | 1 | | |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මට අනුව, ව්‍යාපෘතිය විසින් නියමිත කාලසීමාව තුළ ළඟාකරගත යුතු ප්‍රධාන ඉලක්කගත කාර්යයන් 24 ක් හා ඒ යටතේ වූ උප ඉලක්කගත කාර්යයන් 110 ක් ද හඳුනාගෙන තිබූ නමුත් මෙම ඉලක්ක අතරින් උප ඉලක්ක 83 ක් ම අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වී නොතිබුණි. | 2021 වර්ෂය තුල ව්‍යාපෘතිය සැලකිය යුතු මට්ටමේ ඉලක්ක සපුරාගෙන ඇත. 2021 වර්ෂය තුල සමහර ක්‍රියාකාරකම් සිදු නොකිරිමට හේතු කිහිපයක් තිබේ. | ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | 2021 විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මට අනුව 2.6.2 ක්‍රියාකාරකම යටතේ වූ කාන්තා ව්‍යවසායකයින් වෙත ජාත්‍යන්තර වෙළඳපොල වෙත ළඟාවීම සඳහා කිසිදු වැඩපිළිවෙළක් හඳුන්වා දී නොතිබුණි. | මෙම ක්‍රියාකරකම් ක්‍රියාවලිය 2021 වර්ෂයේදි ආරම්භ කරන ලදී. මෙවැනි ක්‍රියාකාරකම් සඳහා සාධාරණ කාලසීමාවක් අවශ්‍ය වන බැවින් සහ ව්‍යාපෘති සැලැස්ම ලෙස මෙය 2022 වර්ෂයේදි සාක්ෂාත් කර ගන්නා ලදී. | අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | වැඩසටහනේ ක්‍රියාකාරකම් 24 කින් ක්‍රියාකාරකම් 07 ක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු අතර එ සඳහා එ.ජ.ඩො. 822,255.59 ක් වෙන්කර තිබුණි. | පහත හේතුන් නිසා සමහර ක්‍රියාකාරකම් නතර කිරීමට සිදු විය.<br>i. රටේ පවතින කොවිඩ් නරක තත්ත්වය.<br>ii. ගමනාගමනය සහ එක්රැස් කිරීම රජය විසින් සීමා කිරීම.<br>iii. ආර්ථික හා ව්‍යාපාර ප්‍රතික්ෂේප වූ අතර නව බඳවා ගැනිම් සහ ව්‍යාපාරික ක්‍රියාකාරකම් නතර කිරීම. | අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 දෙසැම්බර් 31 වන විට වැඩසටහනේ නියමිත කාලය අවසන් වුවද, ඒහි කාර්යයන් 14 ක ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සියයට 2 සිට සියයට 50 දක්වා වූ අඩු පරාසයක තිබුණි. | යම් යම් හේතූන් මත සමහර ක්‍රියාකාරකම් මන්දගාමී විය.නමුත් බොහෝ සැලසුම් සහගත ක්‍රියාකාරකම් සිදු කරන ලද අතර ඩීඑම්එෆ් ඉලක්ක අනුව බෙදා හැරීම් සාක්ෂාත් කර ගන්නා ලදී.විනිමය අනුපාතිකය උච්චාවචනය වීම නිසා වියදම් කල මුදලේ වටිනාකම සැලකිය යුතු ලෙස අඩු විය. | ව්‍යාපෘති කාලසීමාව තුළ වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඉ) | නවක ශිෂ්‍ය ශිෂ්‍යාවන් 1300 කට අධික සංඛ්‍යාවක් සම්ප්‍රදායික නොවන සහ නව්‍ය ක්ෂේත්‍රයන්හි පුහුණුව ලබාදී සේවයේ යෙදවිය යුතු වුවද, 2021 වර්ෂය අවසාන වන විට ඒ සඳහා අවස්ථාව ලබාදී තිබුණේ ශිෂ්‍යයන් 305 දෙනෙකුට පමණි. | රජයේ සීමාවන් හේතුවෙන් පුහුණුවීම් පැවැත්විම ප්‍රමාද විය.නමුත් මෙම ඉලක්කය 2022 වර්ෂයේදී සාර්ථකව සම්පූර්ණ කරන ලදී. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා පුහුණු සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඊ) | උපදේශන සහ වෘත්තීය උපදේශනය ශිෂ්‍ය ශිෂ්‍යාවන් 1000 කට අධික පිරිසකට ලබාදීම අරමුණ වුවද, 2021 දෙසැම්බර් 31 වන විට එම සහය ලබාදී තිබුණේ සිසුන් 180 දෙනෙකුට පමණි. | 2021 වර්ෂය තුල මාස 08 කට වැඩි කාලයක් පාසල් සහ අනෙකුත් සියලුම අධ්‍යාපන ආයතන වසා දැමූ අතර , මෙම ක්‍රියාකාරකම නවතා දමන ලදී. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |
| (උ) | පුහුණු පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමේදී 2019,2020 වර්ෂ දෙකට සාපේක්ෂව 2021 වර්ෂයේදී සැලකිය යුතු අඩුවීමක් නිරීක්ෂණය වූ අතර 2019 දී සිසුන් 137 දෙනෙකු බඳවාගෙන තිබුණද, 2021 වර්ෂයේදී බඳාගෙන තිබුණේ සිසුන් 78 දෙනෙකු පමණි. එමෙන්ම 2021 වර්ෂයේදී එක් එක් දිස්ත්‍රික්කයන් සඳහා සිසුන් බඳාගැනීම් ඉතා අඩු අගයක් ගත් අතර එය 0 සිට 20 දක්වා පරාසයක විහිදී තිබුණි. | ඔව්. සියලුම ටීවීඊටී ආයතන මාස ගණනාවක් වසා දමා බඳවා ගැනීම් සඳහා සුදුසු කම් නොලබන මාර්ග ගත සැසි පැවැත්වීම නිසා මෙම තත්ත්වය ඇති විය. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඌ) | බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක තුනෙහිම 2019 වර්ෂයේදී රැකියා | බස්නාහිර පළාත ව්‍යාපෘති සඳහා සලකා බැලුවේ 2020 සිට | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය |

| | | | |
|---|---|---|---|
| | අභිමුඛ පුහුණුව සඳහා සිසුන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2020 වර්ෂයේදී ගම්පහ දිස්ත්‍රික්කයෙන් සිසුන් දෙදෙනෙකු හා 2021 වර්ෂයේ දිස්ත්‍රික්ක තුනටම අදාලව සිසුන් 22 දෙනෙකු පමණක් බඳවාගෙන තිබුණි. | පමණි. | පියවර ගත යුතුය. |
| (එ) | ප්‍රදාන වැඩසටහන සඳහා එ.ජ.ඩො. 3,000,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද 2021 දෙසැම්බර් 31 වන විට ඉන් උපයෝජනය කර තිබුණේ එ.ජ.ඩො. 535,267 ක් හෙවත් සියයට 18 ක් පමණි. | හේතු පහත පරිදි වේ.<br>(අ) කොවිඩ් හේතුවෙන් රට වසා දැමීම.<br>(ආ) සංචාරය කිරීම සහ රැස් කිරීම් සඳහා රජය සීමා කිරීම.<br>(ඇ)ඩොලරයේ අගයට සාපේක්ෂව රුපියලේ අගය පහත වැටීම.<br>(ඇ)කොවිඩ් හේතුවෙන් ටිවිඊටි ආයතන වසා දැමීම.<br>(ඉ) ආර්ථිකය පිරිහීම සහ ව්‍යාපාර පරිමාණය අඩුවීම සහ බඳවා ගැනීම් නවතා දමන ලදී. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඒ) | අවම වශයෙන් එක් කර්මාන්ත කවුන්සිලයක් හෝ නිත්‍ය ආදායම් මාර්ගයක් ලබාගැනීම සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුලාභී උපාධිධාරීන් 500 ක් වත් කර්මාන්ත කවුන්සිලයේ මැදිහත්වීම හරහා පුද්ගලික අංශයේ රැකියාවන්හි නිරත කරවීම ඉලක්ක කර තිබුණද 2021 දෙසැම්බර් 31 වන විටත් එම ඉලක්ක සම්පූර්ණයෙන්ම ළඟාකරගැනීමට නොහැකි වී තිබුණි. | රටේ ආර්ථිකය දුර්වල වීම හේතුවෙන් බොහෝ පුද්ගලික අංශයේ සමාගම් සිය ව්‍යාපාර කටයුතු ප්‍රතික්ෂේප කර නව බඳවා ගැනීම් අත්හිටුවා ඇත. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආසියානු සංවර්ධන බැංකුව හා උපදේශන ආයතනය සමග ඇතිකරගත් ප්‍රදාන ගිවිසුමට අනුව, උපදේශන ආයතනය මගින් වැඩසටහන සඳහා කරන වියදම් සෘජුවම ආසියානු සංවර්ධන බැංකුව විසින් උපදේශන ආයතනය වෙත ලබාදෙන අතර 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා එකතුව එ.ජ.ඩො. 249,239 ක් වූ සෘජු ලැබීම් පිළිබඳව මහා භාණ්ඩාගාරයේ ගිණුම්ගත වී ඇති බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ආසියානු සංවර්ධන බැංකුව උපදේශන ආයතනය විසින් දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කරන ලද අතර උපදේශන ආයතනයට අත්තිකාරම් ගෙවීමක් නැත.යොමුකරන ලද මුළු මුදල් ප්‍රමාණයට වන සියලුම මුදල් ආපසු ගැනීමේ අයදුම්පත් වල පිටපත් විගණක වෙත ඉදිරිපත් කර ඇත. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ අරමුණු ඉටුකර ගැනීම සඳහා වෙන් කරන ලද වියදමෙන් ඒ සඳහා වැයකර තිබුණේ එ.ජ.ඩො. 217,765 කි. එය වෙන් කරන ලද මුදලේ ප්‍රතිශතයක් ලෙස සියයට 9 කි. නමුත් උපදේශක ආයතනයේ කාර්යය මණ්ඩලයට ගෙවීම් කිරීම සඳහා වෙන් කරන ලද මුදලින් එ.ජ.ඩො. 317,501 ක් වැයකර තිබුණි. එය වෙන්කරන ලද මුදලේ ප්‍රතිශතයක් ලෙස සියයට 72 කි. ඒ අනුව ආයතනය විසින් වැඩසටහනේ අරමුණ ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකර තම කාර්යය මණ්ඩල ගෙවීම සඳහා ප්‍රතිපාදන මුදල් ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | හේතු පහත පරිදි වේ.<br>i. මුදල් අනුපාතිකය අවප්‍රමාණය විම.<br>ii. උපදේශන ගාස්තු එ.ජ.ඩො. වලින් ගෙවනු ලැබේ.එබැවින් විනිමය අනුපාත වෙනස උපදේශන ගාස්තු සඳහා කිසිදු බලපෑමක් ඇතිකර නැත.<br>iii. ව්‍යාපෘති කණ්ඩායමට ප්‍රදාන බෙදා හැරීමට පෙර පුහුණු වීම් පැවැත්වීමට සහ අරමුදල් වියදම් කිරීමට පෙර බොහෝ මූලික වැඩ සහ එ ආශ්‍රිත වැඩ ඇත. | අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීම සඳහා කළමනාකාරීත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ලියවිල්ල අනුව, නිපුණතා ආංශික සංවර්ධන (ප්‍රදාන) වැඩසටහන සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකාරක තනතුරු 03 ක් බඳවා ගත යුතු වුවත්, එයට පටහැනිව සම්බන්ධීකාරක 05 දෙනෙකු බඳවාගෙන තිබුණි. | ආරම්භයේ සිට මේ දක්වා ව්‍යාපෘතිය යටතේ වැඩ කරන්නේ ප්‍රාදේශීය සම්බන්ධීකාරක තිදෙෙනකු පමණි. උතුර(1), වයඹ(1), ඌව සහ සබරගමුව (1) සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරු තිදෙනා වෙන් කර ඇත.ඒ හැර සම්බන්ධීකාරකවරු සිටියේ නැත. | වැඩසටහනේ ක්‍රියාත්මක කිරීමේ ලියවිල්ලට අනුව නිළධාරින් යෙදවීමට කටයුතු කළ යුතුය. |